# ස.ණ.ස. පුවත් කොළඹින්

2019 - අගෝස්තු - අටවන කලාපය

දායකත්වය රු 15/-











## සාමාජිකයාගේ ණය අවශ්‍යතා සඳහා
## දිසා සංගමයෙන් ණය පහසුකම්

**ජාතික සන්ධානයේ නායක සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසූරිය**

සාමාජිකයින්ගේ වත්කම් වර්ධනය හා ආදායම් උපදවන කාර්යයන් සඳහා මුලධන සම්පාදනය කිරීමට ප්‍රමාණවත් මුදල් නොමැති සමිතිවලට එක් අයකුට උපරිමය ලක්ෂ 50ක සීමාව යටතේ ණය මුදා හැරීම සඳහා වු ණය පහසුකම් සංගමය මගින් සමිතිවලට ලබාදීමට තීරණය කර ඇත. සාමාජික අවශ්‍යතාවන් සඳහා බැහැරින් ණය ගැනීම වළක්වා සමිතිය සමග වන බැදීම තහවුරු කිරීම ද මෙයින් අපේක්ෂිතය. මේ පිලිබදව විස්තර කරමින් සෑම සමිතියකටම උපදෙස් ලිඛිතවම යවා ඇත.

සමිතියේ අතුරු ව්‍යවස්ථාවේ 2.6.1 හා 5.2.1 වගන්ති ප්‍රකාරව දේපල ඇප මත එහි වටිනාකමින් 50%ක් නොඉක්මවන පරිදි ණය දීමේ හැකියාව පවතින අතර පුද්ගලික ණය සීමාවන් තීරණය සමිතියට ගත හැකිවේ. ණය ඉල්ලුම්කරු විසින් සමිතියට ඉදිරිපත් කළ යුතු ණය ඉල්ලුම්පත්‍රය සංගමයේ වෙබ් අඩවියෙන් www.sanasacolombo.lk හෝ සංගමයෙන් හෝ ශාඛා කාර්යාලවලින් හෝ සම්බන්ධිකරන ලේකම්වරුන් මගින් හෝ ලබාගත හැකිය. මෙම ඉල්ලුම් පත්‍රය දැක්වෙන ලියවිලි සමග සමිතියේ නිර්දේශය ඇතිව සංගමයට ඉදිරිපත් කළ යුතුය. මුදල් සමිතියට දෙනු ලබන්නේ සමිතිය සමග ඇති කරගත් ණය ගිවිසුමක් යටතේය. විස්තර කලාප කාර්යාලවලින්, සම්බන්ධීකරණ ලේකම්වරුන් හෝ ප්‍රධාන කාර්යාලයෙන් විමසා දැන ගත හැකිය.

## ප්‍රකාශනයෙන් ප්‍රබුද්ධ සමාජයක්.



කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය මාස් පතා නිකුත් කෙරෙන 'සණස පුවත් කොළඹින්' ප්‍රකාශනයට ප්‍රවෘත්ති, විශේෂාංග ලිපි හා ඡායා රූප සපයනු ලබන සියළුම වාර්තාකරුවන් හා කලාපීය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව 2019.06.30 දින ඩැනිසන් වීරසූරිය ශාලාවේදී පැවැත්වුනි.

මෙම අවස්ථාවට ආරාධිත දේශක ලෙස, ලේක් හවුස් ආයතනයේ සති ප්‍රකාශනයක් සේ නිකුත් කරන සිළුමිණ පුවත් පතෙහි හිටපු ප්‍රධාන කර්තෘ ජ්‍යෙෂ්ඨ ප්‍රවීන මාධ්‍යවේදී තිලකරත්න කුරුවිට බණ්ඩාර මහතා සහභාගීවිය. කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ සාමාන්‍යාධිකාරී තුසිත් කුමාර වීරවර්ධන මහතා හා පර්ෂද සම්බන්ධීකරන ලේකම්වරුද සහභාගි වීමෙන් වැඩමුළුව ආලෝකමත් විය.

ප්‍රකාශන කමිටු ලේකම් නාලක ජයසූරිය මහතාගේ මෙහෙයවීමෙන් පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම. ප්‍රකාශන කමිටු සංස්කාරක මණ්ඩලයේ හේමසිරි බෙනරගම මහතා විසින් සිදු කරමින්, දසක දෙකකට වැඩි ඉතිහාසයක් ඇති සණස පුවත් ප්‍රකාශනය, සාමාජික දැනුම වඩාලීමට මෙන්ම සණස ග්‍රාමීය සංවිධාන ක්‍රමවත්ව පවත්වා ගනිමින් අනාගතයට පෙරගමන් කරුසේ පිය නගන්නට මග පෙන්වන්නෙකු ලෙස ක්‍රියාකර ඇති බව පෙන්වා දෙමින්, පුවත්පත් කලාවේ ජ්‍යෙෂ්ඨ මාධ්‍ය වේදියෙකුගෙන් ලැබෙන උපදෙස්, ලේඛණ කලාවට ඇල්මක් දක්වන සියළු දෙනාටම මෙම ප්‍රකාශනය අනාගතයේ ශක්තිය වේවායි ප්‍රකාශ කලේය.



06 පිටුවට...

## සුප් දන්සල



පසුගියදා පොසොන් පොහෝදින සියලුම සාමාජික සාමාජිකාවන්ගේ එකමුතුවෙන් හා ඔවුන්ගේ ආධාර උපකාරද ඇතිව දහසකට ආසන්න පිරිසක් සදහා ඉතා සාර්ථක ලෙස ඔවිට්ගම සණස සුප් දන්සල 8 වෙනි වරටත් පවත්වන ලදී.

මේ සදහා ගරු සභාපති යු. ආනන්ද මහතා ජ්‍යෙෂ්ඨ කළමණාකාරිනි සුජීවා පුෂ්ප කාන්ති මහත්මිය කාර්ය මණ්ඩලය හා කාරක සභික මහත්ම මහත්මීන් සියලු දෙනා සහභාගි වූහ.

**එස්. විසිතා - ඕවිගම සණස වාර්තාකරු**

## සිසිල් බීම දන්සැල දියගමදී



දියගම සණස සමිතියට අනුබද්ධ 'සෙත්සිරි' ළමා සමාජය මගින් පොසොන් පොහොය නිමිත්තෙන් 02 පිටුවට...

## වාර්ෂික පොසොන් දන්සල

සී.ස. බෝකුන්දර ජාලියගොඩ සණස සමිතිය මගින් වාර්ෂිකව පොසොන් පෝයට දෙනු ලබන සව් දන්සල දහවන වරට ගරු සභාපති සී. ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් ද සාමාජික සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් ද මෙවර ද බෝකුන්දර පරම ධම්ම නිකේතනාරාම විහාරස්ථානය ඉදිරිපිටදී පවත්වන ලදී.

**ජේමසිරි ඒ දිසානායක**
**බෝකුන්දර සණස වාර්තාකරු**



# බලාපොරොත්තුව

සියල්ල ක්‍රියාකාරීය. එකද තත්පරයක් හෝ මග නොහරින සමාජයකි. බලාපොරොත්තු පොදි බැදගත් හැම දෙනාම නින්දෙන් පාන්දර අවදිව උත්සාහ කරන්නේ දෛනික වැඩ ඇරඹුමටය. නින්ද සුවදායක වීද? මනස සන්සුන්ද? කෙනෙකු දිනයේ කාල සටහන අනුව යයි. තවෙකෙකු යෙදෙන විධියට අනුකූලව වැඩ කරයි. කෙසේ වෙතත් දිනය අවසානයේදී තමා කළ කටයුතු ගැන සිහියෙන්, අවධියෙන් සිතා බැලූ විට එලදායි කිසිවක් සිදුව නැත.

ශ්‍රී ලංකික අපි ඉංග්‍රීසින්ගෙන් නිදහස ලබා වසර දසක හතක් ගෙවී ඇත. දින ලෙස ගණනය කළහොත් දින විසිපන්දහස් පන්සිය පනහකට අධික වේ. ජන වර්ගයන් අනුව, ආගම් ඇදහීම අනුව ඉන්දියන් සාගරයේ මුතු ඇටයට එදා තිබු පොළොවේ අයිතිය මුහුදු රළට දියවී. මිනිස් ක්‍රියාකාරකම් නිසා පසෙන් ගොඩ වී තැනෙන කෘතීම වරායන් ඉදිවී හැඩය වෙනස් වෙමින් පවතී. රටේ භූමියට එසේ සිදුවෙද්දී, විශ්ව ගම්මානයක් ලෙස වර්තමානයේ තාක්‍ෂණික දියුණුවත් සමග තොරතුරු ඒකරාශී කිරීමට තත්පර කීපයකින් හැකියාව තිබියදී, රටේ ජිවත්වන ජනතාව ආදි වාසීන් සමග සතුන් දඩයම් කරමින්, රුහිරු ගලායන මස් බුදිමින්, ඉලුක් හෝ පොල්අතු වෙනුවට කොන්ක්‍රීට් සෙවිල්ලෙන් ආවරණ තනා ගෙන අඩ නිරුවතින් සමාජයේ සැරිසරමින් සිරුරේ ස්නායු පද්ධතිය මත් වතුරෙන් සතපවා ගෙන, හෙට උපදින පරපුරට දෙන ආදර්ශය නම් ණය ගැතියන් වීමයි.

මුළු මහත් සමාජය අයාලේ සැරිසරමින්, අදුරේ අතපතගාමින් අරාබිකරයෙන් ලැබෙන ඉන්ධන මත හා යුරෝපයෙන් ලැබෙන ගල් අගුරු මත යැපෙමින්, රටපුරා ස්වාභාවිකව හමා යන සුළං රැල්ලට කාබන්ඩයොක්සයිඩ් ප්‍රශ්වාස කරමින් හූල්ලමින් පිලමත ඇනතබා එළොවත් මෙලොවත් ගැට ගසන්නට, පූජනීය වූ ස්ථාන වටා රං වැට ඉදිකරමින්, රැළි ගැන්වී ඇති උදරය පිට කොන්දට අලවාගෙන දෙව්ලොව යන්නට හෝ බඹලොව ජනිත වන්නට චතුරාර්‍ය සත්‍යයත්, අරිඅටගි මහත් ජප නූලෙන් ගැටගසා තබා බවුන් වඩති.

සණස ක්‍රියාවන් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. මුදල් ඒකරාශී කරමින් ණය ලබාදී සාමාජික ජීවනය ශක්තිමත් කිරීම සේම ගුණදර්ම මත පිහිටා කටයුතු කරමින් සාමකාමී, දැහැමි සමාජයක් ඇති කිරීම, දසක දහයක් ඉක්මවා ගිය සමුපකාර ව්‍යාපාරයට ශ්‍රී ලංකාව තුල ඉහත කී වැදගත් කාරණා දෙක පිළිබඳව අවම වශයෙන් සමස්ථ ජනගහනයෙන් හතරෙන් එකක් හෝ පුබුදු වන්නට හැකිවී ඇද්ද යන්න ප්‍රශ්නයකි.

මිනිසාගේ පැවැත්මට සැළසුම් හැදිය යුත්තේ නිවසෙනි, පවුල් ඒකකය තුළිනි. විවාහක දෙමාපියන් තම දරුවන්ට උගන්වා සමාජය නැමැති මුහුදේ රළ පහරවල් වලට මුහුණ දෙමින්, කුණාටු හා සුළි දියවැල් මගහරවා ගනිමින් යාන්ත්‍රික බෝට්ටුව නම් වු පවුල් සංස්ථාව පැදයා යුතුවේ. ඒ සදහා පවුලේ එකමුතුකම හා අවබෝධය තිබිය යුතුය. පැරැන්නෝ තම පවුලේ සියළු දෙනාම රාත්‍රි භෝජනය ලබා ගැනීමේදී එක මේසයක් වටා ඉදගනිමින්, තමාට අවශ්‍ය ප්‍රමාණයට කෑම බෙදා ගනිමින් දිනයේ සිදුවූ හා කල කී දෑ පිළිබදව විචාරමින් අවබෝධය ලබා තීරණ ද ගන්නා ලදී.

අද, මැද සාලයේ රූපවාහිනී යන්ත්‍රයට හැම දෙනාගේම අවධානය යොමු වී තම බත්පතේ රසයවත් නොවිද, කෑ නොකෑ දේ නොදැන, බකුසු න්‍යායෙන් නින්දට යති. රට කරන පාලකයෝද ආත්මාර්ථකාමීව ඔවුන්ගේ බදුනට කෑම බෙදාගෙන බුක්ති විදිති. පවුලේ පැවැත්ම සුනුවිසුනු වී බලාපොරොත්තු සුන්වී ඇත. අඩක් ගුණදම් ගැන කථා කරන සණස සාමාජිකයිනි, හිතන්න, නව සිතිවිළි ඔස්සේ ඔබේ සාමාජිකයාව දිරි ගන්වා හෙට දිනයට මුහුණ දෙන්න බලාපොරොත්තු ඇති කරවන්න.

**ස.ණ.ස. පුවත් කොළඹින්**

☆ **අධීක්ෂණය**
ඩී. වීරසූරිය
තුසිත් කුමාර වීරවර්ධන

☆ **ප්‍රකාශන කමිටුව**
සී. ගමගේ
එම්.ඩී. ජිනදාස
හේමසිරි බෙනරගම
එම්.රොහාන් ජේ. පෙරේරා
යු.ඩී.එස්. වීරසිංහ

☆ **විධායක සහාය**
නාලක ජයසූරිය

☆ **පරිගණක අක්ෂර හා සැලසුම**
කේ. ඒ. සම්පත් ප්‍රසංග

**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය**
220/1, හයිලෙවල් පාර, මහරගම.
දු.ක. 0112 851213, 0112 848801, 0114 301228
sanasacolombo@gmail.lk

# ආයුර්වේදයට යොමුවන්න.



බ/ප ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අනු දැනුම ඇතිව කො/දි ආයුර්වේද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් මගින් මොරටුව ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය ඒකකයේ එකමුතුවෙන් උතුරු කටුබැද්ද සණස සමිතියේ සංවිධානයෙන් උතුරු කටුබැද්ද සණස රැස්වීම් ශාලාවේ පහත සදහන් මාතෘකා යටතේ දේශන පැවැත්විය.

1. ලුණු භාවිතය අවම කිරීම මගින් බෝ නොවන රෝග වැලැක්වීම.

2. දේශීය පාන හදුන්වා දීම හා ප්‍රදර්ශනය

3. ඩෙංගු රෝග නිවාරණය

මෙම දේශන සදහා වෛද්‍ය එල්.අයි.ඒ.ද. සිල්වා මයා, වෛද්‍ය එල්.ඩී. ලක්මානි ලියනගේ මිය, වෛද්‍ය යු.එම්. හේවාපතිරණ මයා, වෛද්‍ය එම්.එස්.එන්. ශිහාරා මිය සහභාගි වුහ.

ජ්‍යේෂ්ඨ කථිකාචාර්යය වෛද්‍ය හිමාලි ද සිල්වා දේශීය වෛද්‍ය විද්‍යායතනය කොළඹ විශ්ව විද්‍යාලය රාජගිරිය ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධනී සංගමය හා එක්ව එහි අනුග්‍රහයෙන් දේශීය වෙදකමේ පරිදි ලුණු භාවිතය මගින් බෝ නොවන රෝග වලක්වා ගැනීම ගැන දේශනයක් කලහ. මෙම ආයුර්වේද දේශනය සදහා සාමාජික සාමාජිකාවන් 275කට ආසන්න ප්‍රමාණයක් සහභාගි වූහ.

**නිමල් කොළඹගේ - උතුරු කටුබැද්ද සණස**

# මත්ද්‍රව්‍ය සහ ළමා සමාජය
## මතින් තොර රටක්

මේ තේමාව වසර ගනනාවක සිටම අපට හුරු පුරුදු වැකියක්. රජය මෙම මතට 'තිත' සදහා නොයෙකුත් උපක්‍රම යොදමින් කටයුතු කිරීම ප්‍රශංසනීයයි. එය සාර්ථකව ක්‍රියාත්මක වනබව අපට පෙනේ. එහෙත් ඒ සියළු මැඩලීම් සමගම අළුත් මත්ද්‍රවයයන් අළුත් ක්‍රමවලින්, අළුත් හැඩයන්ගෙන් ජනතාව කරා ලංවෙන බව පැහදිලිය. මේවා පාලනය කිරීමට අපහසුවන්නේ මත්ද්‍රව්‍ය සහ ජාත්‍යන්තරය බූවල්ලෙක් මෙන් එකට බැදී ඇති නිසයි. මත්ද්‍රව්‍යය බූවල්ලාගේ අඩුවලින් ලෝකය වෙලී තිබෙනවා. මෙහිදී අපට පෙනෙන්නට තිබෙන කණගාටුම කරුණ නම් අපේ බාල පරපුර වේගයෙන් මේ මත් ද්‍රව්‍යයට සමීපවීමයි.

පාසල් ළමුන් දැන් දැන් මත්ද්‍රව්‍යය වාහකයන් බවට පත්ව තිබීම අතිශයෙන්ම කණගාටුවට කරුනකි. අපේ රටේ අනාගතය බාරගැනිමට සිටින ළමා පරපුර, අයාලේ යන උන්මත්තකයන් පිරිසක් බවට පත් කරමින් යන මේ ප්‍රයත්නයට අප සැම වගකිව යුතුයි. අවුරුදු 10 සිට 15 දක්වාවු කුඩා දරුවන් මත්ද්‍රව්‍ය ප්‍රවාහකයන් බවට පත්ව තිබේ. විශේෂයෙන් නාගරික පාසල්වල මේ තත්වය වඩාත් පවතී. දැනට මේ අය මත්කුඩු පාවිච්චියට නොගත්තත් ප්‍රවාහන කුලිය වශයෙන් ඔවුනට ලැබෙන මුදල වයසට වඩා බොහොම වැඩියි. එයින් වන්නේ එම මුදලට ඇති ගිජුකම ක්‍රමයෙන් වැඩිවීමයි. එසේම නගරයේ ජනාකීර්ණ පාසලේ සිට ගමට 'සිසුසැරියන්' තිබෙන නිසා, ගමේ කාටත් පහසුවෙන් නීති විරෝධීවම ලඟටම ලබාගන්නට පිළිවන්. පාසල් වෑන් රථ මගින්ද මෙම කටයුතු සිදුවනවා. ඉදිරි පාසැල් නිවාඩු කාලවලදී මෙම මත් ප්‍රවාහන කටයුතු අඛන්ඩව ගෙනයාම සදහා ජංගම දුරකතන පවා පාසල් දරුවන්ට නොමිලේ ලබාදුන් අවස්ථාද අසන්නට ලැබේ.

මේ නිසා ආදරණීය දෙමව්පියනි, මේ ගැන වැඩි අවධානයක් ගෙන කටයුතු

**ලක්ෂමන් ගුනවර්ධන,**
**පිටිපන නගරය සණස වාර්තාකරු**

# 11 වන වරටත් පහේ හපනුන්ට අත්වැලක් වු ඕවිටිගම සණස



ඕවිටිගම සණස සමිතිය මගින් පහ ශ්‍රේණියේ දරු දැරියන් වෙනුවෙන් මීගොඩ ධර්මරාජ විද්‍යාලයේ දරුවන් 150 දෙනෙකු සදහා ශිෂ්‍යත්ව වැඩසටහනක් පසුගියදා ගරු සභාපති යූ. ආනන්ද මහතා ජ්‍යේෂ්ඨ කළමනාකාරිනි සුජිවා පුෂ්පකාන්ති මහත්මිය ඇතුලු කාර්ය මණ්ඩලය කාරක සභික මහත්ම මහත්මීන් හා ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ගුරු මණ්ඩලයේ සියලු දෙනාගේ සහභාගිත්වයෙන් පැවැත්විය.

ඉතා වටිනා දේශනයක් කොළඹ අධ්‍යාපන කලාපයේ අධ්‍යාපන උපදේශක කෝසල තොටවත්ත මහතා විසින් සිදු කරන ලදී.

**එස්. විසිතා**
**ඕවිටිගම සණස කාරක සභික**

01 පිටුවෙන්...
## සිසිල් බීම දන්සැල දියගමදී....

සංවිධානය කරන ලද සිසිල් බීම හා බිස්කට් දන්සැල පොසොන් පොහෝ දින දියගම සාලවනෝද්‍යාරාම විහාර ස්ථානය අසලදී ලබාදුනි.

'සෙත්සිරි' ළමා සමාජයේ නිලධාරී මණ්ඩලය ඇතුළු සමස්ත සාමාජික සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් කාන්තා කමිටුවේද සහාය ඇතිව ඉතා සාර්ථක ලෙස මෙම දන්සැල සංවිධානය කර තිබුණි.


**චමිලා ජයතුංග - දියගම සණස ලේකම්**

ස.ණ.ස.
පුවත් කොළඹින්

# සතුට ඉතුරුණු සේවක



## ගුණදම් පුරන්නට මග



කැස්බෑව කලාපයේ මාවිත්තර උතුර 'සමගි' සණස සමිතිය, තම සාමාජිකත්වයට උතුම් ගුණදම් පුරන්නට, සුමධුර දහම් දෙසුමක් දේශනා කරන්නට සංවිධානය කරමින් ජුනි 30 දින සවස් වරුවේ තම සමිති ශාලාවට, අමරපුර සිරි සද්ධම්මවංශ මහා නිකායේ අනුනායක ධුරන්ධර ත්‍රිපිටකාචාර්ය පූජ්‍යපාද බොරැල්ලේ අතුල අනුනායක ස්වාමීන්වහන්සේ වැඩම කරවා දම් සිසිල් දිය බෙදා දෙන ලදහ.

චෛතිහාසික ලාහුගල මහා සෑයෙහි, පුරාවිද්‍යා කැනීම්වල දී සොයාගත් ලොව්තුරු බුදුරජාණන් වහන්සෙගේ ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා පුදන්නට පිළියන්දල මාවිත්තර සිරි තිසරණ ධර්මායතනයට වැඩම කරවා, ඇසළ පසළොස්වක පොහෝ දින උවැසි උවැසියන් සදහා විහාරාධිපති වහන්සේ විසින් අවස්ථාව සලසා දෙන ලදී. එදින අටසිල් සමාදන් වූ පන්සියයක් සිල්වතුන් සදහා හීල් දානය. මාවිත්තර උතුර 'සමගි' සණස සමිතියේ කාරක සභික සභිකාවන් හා සාමාජික පිරිස් මෙත් සිතින් පිරිනමන ලදී

**බී.වී.එල් චන්ද්‍රරත්න**
**ගරු සභාපති**

## අම්මා

**ලීලා බුලත්ගම - කහටපිටිය සණස වාර්තාකාරිණී**

අතට වෙරළු ඉනට පලා බරටම දර කඩා ගෙනේ
නාඩන් මගෙ පුංචි දුවේ අම්මා එයි විගස කිනේ
රස කවියේ උල්පත වී පුංචි සිතට ගැලුව දිනේ
මට අම්මා තරම් කෙනෙක් නැහැ මේ ලොව පහල වුනේ

අත්තන ගලු ගල මුදුනේ සිරිසඟබෝ රජු එදිනේ
හිස දන්දුන්නලු පුතුනේ - ඒ ගැන දැනගන් සොදිනේ
කවි රසයයි. කිරිසුවදයි එක විලසට මන බැදුනේ
තෙරුවන් ගුණ සුවඳ හමයි අම්මාගේ මුව රැදුනේ

බඹ විහරන පිරි හඳවත මනු ගුණ රැක ගන්ට
බව දන් දුන්නේ නිතරම කදුලෙන් හිනැ හෙන්ට
මට සැපතකි. ඔබ ඇදි රෙදිකඩ සිප සිප ඉන්ට
අවසර අම්මේ යලි ඔබ නිවනෙදි හමු වෙන්ට

ලොව දස අත සොදුරුවුනේ අම්මා යන අකුරු තුනෙන්
මනු හඳවත් එලිය කලේ මව් කිරිවල මියුරු ගුනෙන්
අපගේ ජීවිත සරුකල මෙත් කරුණා මහඟු දැනෙන්
මෙතේ බුදුන් දැක නිවෙන්න අම්මේ ඔබ කරපු පිනෙන්

## උතුම් පරිත්‍යාගයක්



උතුරු කටුබැද්ද සණස සමිතියේ යොවුන් කාන්තා කමිටුව උතුරු කටුබැද්ද සණස සමිතියේ සාමාජිකයන්ගේ අසනීප අවස්ථාවන් වලදී ප්‍රයෝජනයට ගැනීම සදහා රෝද පුටුවක් කිහිලිකරු ජෝඩු දෙකක් සහ ක්‍රීඩා භාණ්ඩ උතුරු කටුබැද්ද සණස සමිතියට ප්‍රදානය කලේය. මෙම ප්‍රදානයට යොවුන් කමිටු නිලධාරින් හට සිය සමිතියේ ස්තුතිය පුද කලහ.

**නිමල් කොළඹගේ - උතුරු කටුබැද්ද වාර්තාකරු**

## සුහද හමුව

කොළඹ දිසා සංගමයේ මෙහෙයවීමෙන් දිස්ත්‍රික්කයේ ප්‍රාථමික සමිති රාශියක සේවක සේවිකාවන් සහභාගිත්වයෙන්, ජාත්‍යන්තර සමුපකාර දිනයදි වත්තල 'පෙගසස් රීෆ' හෝටලයේදි සුහද හමුවක් පවත්වන ලදී.

නැටුම් ගැයුම් හා ජන ක්‍රීඩා රැසක් ඇතුලත් වු මෙම අවස්ථාවට, කොළඹ දිසා සංගමයේ ගරු සභාපති ඩී. වීරසූරිය ගරු අධ්‍යක්ෂ වරුන් වන, සී. ගමගේ, සුදත් පුෂ්පකුමාර, ප්‍රසන්න කුමාර ගීකියනගේ, යසසිරි අමරතුංග යන මහත්වරුන්ද ප්‍රකාශන කමිටු නියෝජිත හේමසිරි බෙනරගම හා එම්.ඩී. ජිනදාස මහත්වරුන් සහභාගි විය. දිසා සංගමයේ සාමාන්‍යාධිකාරි තුසිත් කුමාර වීරවර්ධන මහතා ඇතුළු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ද මේ අවස්ථාවට සහභාගි වන ලදී.



**එම්. රොහාන් ජේ. පෙරේරා**

## දියගම සණස සුභ සාධක ක්‍රමය ආරම්භ කරමින්



සහෝදර සාමාජිකයෙකුට ඇතිවන ආපදාවකදී එකමුතුව පරිත්‍යාග කිරීමේ ගුණය දියුණු කිරීම සදහා පුරුදු කරමින් අන්‍යෝන්‍යාධාර දිවියට හුරු කිරීමේ අරමුණ පෙරදැරිව සීමාසහිත දියගම සණස සමිතියේ නව සුභ සාධක ක්‍රමය අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක කෙරුන අතර ඒ පිළිබදව දියගම සණස සමිතියේ සමස්ත සාමාජිකයින් දැනුවත් කිරීමක් කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ ගරු සභාපති සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසූරිය මහතාගේ ප්‍රදානත්වයෙන් පසුගියදා මහසභා රැස්වීමේදී සිදුකෙරින.

**චමිලා ජයතුංග - දියගම සණස ලේකම්**

### අප වාර්තාකරුවෝ



**සී.ස. පැපිලියාන සණස සමිතියේ**
**එච්.එම්. සසිකා ගනානි පෙරේරා මහත්මිය**
**වාර්තාකාරිණිය ලෙස පත්කර ඇත.**

## පිංකම් මාලාවක්

හෝමාගම මහකටුවාන ගලවිලවත්ත සණස සමිතිය වෙසක්, පොසොන්, ඇසල මස පෝය දින අරමුණු කරගෙන පිංකම් මාලාවක් සිදුකරන ලදී.

වෙසක් පොහෝදින වෙනුවෙන් සණස ඉසුරු උත්සව ශාලාවේදී ගරු නියඳගල පුෂ්පාරාමාධිපති හෝමාගම ශාසනරක්ෂක බල මණ්ඩලයේ ගරු ලේඛකාධිකාරී, ශාස්ත්‍රපති පණ්ඩිත කහහේනේ පඤ්ඤානන්ද නායක ස්වාමින් වහන්සේගේ ආරාධනයෙන් ගරු කෙරමිණියේ ධම්මරතන ස්වාමින්වහන්සේ විසින් ධර්ම දේශනයක් සිදුකරන ලදී.

පොසොන් මස පෝය දින නිමිති කරගෙන වසරක් පාසා පවත්වන වටරැක සෙනෙහස වැඩිහිටි නිවාසයේ දහවල් දානමය පිංකම ජුනි මසදී සමිතියේ මියගිය සැමට පිං පමුණුවා අධ්‍යක්ෂ මණ්ඩලයට හා සාමාජික සාමාජිකාවන්ට කළමණා කරුවන් දෙපළට සෙත්පතා සිදුකරන ලදී.

පොසොන් පෝය වෙනුවෙන් ගලවිලවත්ත විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ සිල් සමාදන් වු උවැසි උවැසියන් වෙනුවෙන් දහවල් දානය 200 ක් වු පිරිසට පිරිනමන ලදී. අවසානයේ මේ සියළු පිංකම් සිදුකිරීමෙන් පසු අප සමිතියේ අවු 28ක් ලේකම් වශයෙන් කටයුතු කර අපවත්වී වදාල ශාස්ත්‍රපති පණ්ඩිත රත්මලානේ සුජාත නායක ස්වාමින්වහන්සේටත් අවු 28 ගිහි අනුශාසක වශයෙන් කටයුතු කල හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඩී.ඒ. කරවිට මැතිතුමාටත්, සමිතියේ මියගිය සියළු සාමාජික සාමාජිකාවන්ටත් පිං අනුමෝදන් කරන ලදී.

**ධර්මවේදී එම්.ඩී. ජිනදාස**
**මහකටුවාන ගලවිලවත්ත සණස සභාපති**

## දැනුවත් කිරීමේ වැඩමුළුවක්

කැස්බෑව කලාපයේ කළමණාකරුවන් හා කාරක සභිකයින් දැනුවත් කිරීමේ වැඩමුළුවක් කොළඹ දිස්ත්‍රික් සංගමයේ ගරු සභාපති සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සී.ස. මකුළුදූව, නාම්පමුණුව පලිගෙදර සණස ශාලාවේදී පවත්වන ලදී. මේ සදහා කැස්බෑව කලාප අධ්‍යක්ෂක සී. ගමගේ මහතා සහ දිස්ත්‍රික් සංගමයේ සාමාන්‍යාධිකාරී තුසිත් කුමාර වීරවර්ධන මහතා ද එක් ව සිටි අතර පර්ෂද සම්බන්ධීකරණ ලේකම් කේ. චන්ද්‍රසිරි මහතා විසින් මෙම වැඩමුළුව සංවිධානය කරන ලදී. සමිතියේ ගරු සභාපති රත්නසිරි කල්දේරා ඇතුලු කාර්ය මණ්ඩලයට විශේෂ ස්තුතිය

**සී. ගමගේ ගරු අධ්‍යක්ෂක**

# සුරක්ෂිත ආයෝජන කළඹක් සාදාගන්නේ කෙසේද?



**තුසිත් කුමාර වීරවර්ධන**
**සාමානයාධිකාරී**
**කොළඹ දිසා. සංගමය**

අප පුද්ගලයින් වශයෙන් සහ ව්‍යාපාර වශයෙන් මහන්සි වී ධනය උපයයි. එම උපයන ධනය ඉතා සාධාරණව සහ මහන්සියෙන් ඉපයිය යුතු බව සෑම ආගමකම දේශනා කර ඇත. විශේෂයෙන් බෞද්ධ සංකල්පය තුල මෙය සිදුකල යුතු ආකාරය ඉතා සරලව පෙන්වා දී ඇත. ඒ කෙසේද යත්? තමා උපයන සියළු ධනය කොටස් හතරකට බෙදා, එක් කොටසක් යැපීමටද, තවත් කොටසක් හදිසි අවශතා සදහා ප්‍රයෝජනයට ගැනීමට ඉතිරි කිරීමෙන්ද, ඉතිරි කොටස් දෙක යහපත් ආයෝජන ක්‍රියාමාර්ගයකද යොදවන ලෙසය. එසේම ආයෝජනය තුලින් ස්ථිරභාවයත, තිරසාර පැවැත්මත්, සංවර්ධනයත් යන කරුණු ඉෂ්ඨ වීමෙන් පුද්ගලයාගේත් ආයතනයකත් වර්ධනය සිදුවන බව ඔබට ඉතා පැහැදිලිව පෙනෙනු ඇත.

මෙම ත්‍රිත්ව කරුණු ඉෂ්ඨ වී නිරන්තර වර්ධනය සිදුවීමට නම් අප නිවැරදි ආයෝජනයක් සිදුකල යුතුය. අද මා බලාපොරොත්තු වන්නේ සමුපකාර සමිතියක් විසින් තම අරමුදල් හෝ ලාභය ආයෝජනය කිරීමේදී විශේෂයෙන් සලකා බැලිය යුතු වැදගත් සාධක කිහිපයක් පිළිබදව ඔබව දැනුවත් කිරීමටයි. විශේෂයෙන් මේ සදහා මගපෙන්වීමක් ප්‍රඥප්තියේ 41(1) වගන්තියට අනුව පෙන්වා දී ඇත. එහි සදහන් ආකාරයට රාජ්‍ය බැංකුවක තැන්පත් කල යුතුය. නමුත් රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා මහ බැංකුව පිළිගත් බැංකුවක හෝ සමුපකාර සංගමයක හෝ සමිතියක හෝ සමුපකාරයකට අනුබද්ද මුල්‍ය ආයතනයක තැන්පත් කළ හැකිය. යනුවෙන් දක්වා ඇත. මෙය හොද මගපෙන්වීමකි. නමුත් ඔබ ඔබගේ වටිනා ආයෝජනයේ සුරක්ෂිතභාවය පිළිබදව සැලකිලිමත් වීමේදී හොද ආයෝජන කළඹක් සමිතිය තුල ඇතිකරගත යුතුය. ඒ සදහා අප පහත සදහන් සාධක කෙරෙහි වඩා විචක්ෂණශීලිව සහ යථාර්තයෙන් යුතුව බැලීමට පුරුදු විය යුතුය. දැන් අපි එම සාධක එකින් එක විමසා බලමු.

## 01. ඔබ සිදුකිරීමට බලාපොරොත්තු වන ආයෝජනයේ අරමුණ පිළිබදව සලකා බැලිය යුතුය.

මින් අදහස් කරන්නේ ඔබගේ සමිතිය මෙම ආයෝජනය සිදුකරනු ලබන්නේ කුමන අනාගත හා වර්ථමාන සැලසුම් සදහාද යන්න පිළිබදව හොද මාර්ග සැලැස්මක් සාදාගත යුතුය.

උදාහරණ ලෙසඃ

- ✦ එදිනෙදා වියදම් පියවා ගැනීමට මාසික ආදායම් ලබා ගැනීමේ අරමුණින්ද?
- ✦ අනාගතය සදහා වත්කම් ගොඩනැංවීමේ අදහසින්ද?
- ✦ ආයතනික ද්‍රවශීලතාවය ආරක්ෂා කිරීමටද?
- ✦ සමාජීය සුභසාධන කටයුතු අරභයා අරමුදල් ගොඩනැංවීමටද?
- ✦ ලාභ ලැබීමේ අරමුණින්ද?
- ✦ ඉහත කිසිවක් නොමැතිව අතිරික්ත මුදල් වලට කුමක් හෝ සිදුකල යුතුය යන අරමුනින්ද?

ඉහත මා පෙන්වා දුන් උදාරන ඔබ සමිතියේ ආයෝජනයේ මුලික සුරක්ෂිතතාවය ඇති කිරීමට ඉතා වැදගත් සාධකයක් වෙයි. මෙම සිතිවිල්ල ආයෝජනයේ මුලික සැලැස්ම නම්වේ..

## 2. අවදානම් කළමනාකරනයට අවශ්‍ය සාධක පිළිබදව සලකා බැලීම

මුලික ආයෝජන සැලැස්මට අනුව දෙවනුව සලකා බැලිය යුත්තේ එම අරමුණ ඉෂ්ඨ කර ගැනීම සදහා සමිතිය විසින් දැරීමට සුදානම් වන අවදානමේ ප්‍රමාණයයි. සෑම විටම අපගේ මුලික ආයෝජන සිතිවිල්ලට සාපේක්ෂව දැරීමට සුදානම් වන අවදානමේ ප්‍රමාණය තීරණය වෙයි. මීට සරලව උදාහරන කිහිපයක් පෙන්වා දිය හැකිය.

- ✦ වියදම් පියවා ගැනීමේ අරමුණින් යම් ඉහල පොලී ප්‍රතිශතයක් සහිත අවදානම් ආයෝජනයන් තුල වගකීම් භාරගනිමින් හැසිරිය යුතුය. බොහෝ දුරට මෙම අරමුණ ඉෂ්ට කිරීමට නම් කෙටිකාලීන ආයෝජන සදහා යොමුවීම වඩා යෝග්‍ය වෙයි. එමගින් ආයෝජන කළඹේ ඉපයීමේ ශක්තිය අපතේ නොයැයි.
- ✦ ද්‍රවශීලතාවය අරමුණු කර ගනිමින් තම සමිතියේ ප්‍රධාන වගකීම වන සාමාජික තැන්පතු වල තිබෙන කල්පිරීමේ කාලයට සමානව හෝ ඊට මදක් වැඩි කාලයක් සදහාවත් අවශ්‍ය ආයෝජන සැලැස්ම සකසා ගත යුතුය.
- ✦ අනෙකුත් අරමුණු සහිතව ආයෝජන සැලැස්ම සිදුකරනවා නම් ඉහල ප්‍රතිලාභයක් සමග එන අවදානමට අනිවාර්යෙන් මුහුණ දීමට ශක්තියක් තිබිය යුතුය.
- ✦ විශේෂයෙන් තම සමිතියේ අවදානමට මුහුණ දීමේ ශක්තිය පිළිබදව මනා අවබෝධයක් සහ ශක්තිමත් උපාය මාර්ග සකසා තිබිමද අත්‍යාවශ සාධකයකි. මෙය හැම විටම කළමනාකරනය කරනු ලබන්නේ සමිතියේ ආයෝජන ප්‍රතිපත්තිය තුලය. එකී ප්‍රතිපත්තිය සෑම විටම වෙළදපොල වෙනස්වීමේ සාධක මත සෘජුවම වෙනස් විය යුතුය. එසේ නොවුනහෝ අවදානමට මුහුණ දීමට නොහැකිව තම ආයෝජන සැලැස්ම අසාර්ථකවීමට පුළුවන. මෙම ආයෝජන ප්‍රතිපත්ති වඩාත් ශක්තිමත් වන්නේ සමිතිය සතුව තිබෙන පහත සදහන් සාධක මතය.

1 අරමුදල් ගලාඑන මාර්ගයන් හි පවතින ශක්තිමත් භාවය.

2 වත්කම් වලට සාපේක්ෂව වගකීම් දැරීමට හැකි ප්‍රමාණය

3 තම සාමාජිකයින්ගේ තිබෙන ඉපයීමේ ශක්‍යතාවයන්

4 කාරක සභාවේ හා කළමනාකරනයේ තිබෙන දැනුම හා ආකල්ප සහ තාක්ෂණික හැකියාවන්

5 සමිතියේ ජීව කාලය සහ විශ්වසනීයත්වය.

6 උපරිම ඵලදායීතාවය සහ මෙහෙයුම් කාර්යක්‍ෂමතාවය.

එසේම නායකත්වය සහ තීරණ ගැනීමේ නම්‍යතාවය යන කරුනු ධනාත්මකව තිබෙන තාක්කල් ඕනෑම සමිතියක සිය ආයෝජන තුලින් උපරිම ඵලදායීතාවයක් ලැබිය හැකිය.

## 03 . තම සමිතියේ ආයෝජන කළඹ උපරිම ඵලදායීතාවයක් ලැබෙන පරිදි මිශ්‍ර කර තිබීම.

මෙම සාධකයද වඩාත් ශක්තිමත් ආයෝජන සුරක්ෂිතතාවයක් ඇති කිරීමට ඉවහල් වන තවත් එක් ප්‍රධාන කරුණකි. සුරක්ෂිත ආයෝජන කළඹක් ප්‍රධාන වශයෙන් පහත පරිදි ලෙස මිශ්‍රණය වී තිබිය යුතුය.

1. ආයෝජනය කාලය අනුව : කෙටිකාලීන ආයෝජන, මධ්‍ය කාලීන ආයෝජන, දිගු කාලීන ආයෝජන
2. අවදානම් වර්ගීකරණය අනුව : ඉහල අවදානම් සහිත, අවම අවදානම් සහිත, අවදානම් නොමැති
3. ආයෝජනය ක්‍රම වේදයන් අනුව : භාණ්ඩාගාර බිල්පත්/සුරැකුම්පත්, ස්ථාවර/වානිජ පත්‍ර, ණය සුරැකුම්, සාමාන්‍ය ඉතිරි කිරීම්, ස්ථාවර වත්කම්

ඉහත මිශ්‍රණයන් අනුව සමිතියක ආයෝජන කළඹ බෙදීගොස් තිබේ නම් එහි සුරක්ෂිතභාවය ඉහල අගයක් ගනී. මෙම මිශ්‍රණය සෑම විටම වඩා තරඟකාරී ලෙසත් ඉහලම ප්‍රතිලාභය ලැබෙන පරිදිත් සකස් කර ගැනීමට සමිතියේ කළමණාකරනය ශක්තිමත් භාවයෙන් යුක්ත විය යුතුය.

## 04 සෑම විටම ඉහලම ප්‍රතිලාභයක්, අවම වියදමත් පිළිබදව පමනක් විමසිලිමත් නොවීමේ සාධකය.

මෙම සාධකය මත ආයෝජන කලඹේ ප්‍රතිලාභය තීරණය වෙයි. එසේම මෙම සාධකය සැලකීමේදී ඉතා පැරණි දුර්මතයක් වෙළදපොල තුල දක්නට ඇත. එනම් ඉහල ප්‍රතිලාභය තුල ඉහල අවදානමක් සහ පහල ප්‍රතිලාභය තුල පහල අවදානමක් සහිතයි යන්නය මෙය වර්ථමාන තරඟකාරී තුල වැරදි කියමනකි. ඊට හේතුව වන්නේ මා මීට පෙර කථාකල සාධක 3න තුල පිහිටා තම සමිතියේ ආයෝජන කළඹ සකස් කරයි නම් මෙම කියමන අදාලවන්නේ නැත. ඊට හොදම උදාහරණය වන්නේ  පසුගිය කාලය තුල ශ්‍රී ලංකාවේ තුල ප්‍රචලිතව සිට කඩාවැටුණු බොහෝ පෞද්ගලික ආයෝජකයන් තුල තම සේසතම දැමූ පුද්ගලයින්ට හා ආයතන වලට නම් මෙම කියමන නිවැරදිය. මදක් හොදින් සිතා බලන්න. එම සියළුදෙනාම තම ආයෝජන සැලැස්මේදී සලකා බලා තිබෙන්නේ ඉහල ප්‍රතිලාභයක් පමනි. නමුත් අනෙකුත් කරුණුද සලකා බැලුවානම් තමුන්ගේ ආයෝජනයන් අදටත් සුරක්ෂිතව පවතී.

## 05 ඇතිවිය හැකි දුෂන සහ වංචා වැලැක්වීමට අවශ්‍ය වන ශක්තිමත් අරමුදල කළමණාකරන ක්‍රමවේදයක් ගොඩනැංවීමේ සාධකය.

මෙම සාධකය 100% ක්ම මානව කළමනාකරනය, තාක්ෂණය සහ තීරණ ගැනීමේ හැකියාවන් යන සාධක මත ගොඩනැංවෙනු ඇත. විශේෂයෙන්ම වෙළද පොල තුල සිටින තැරැව්කරුවන්ට සහ ආයතනවලට දොස් කීමෙන් පලක් නැත. එය ඔවුන්ගේ තරගයයි. නමුත් අපතුල තිබෙන ඉහත ශක්තීන් හා ගුණාංග අපගේ ආයෝජන ප්‍රතිපත්තිය තුලට සම්බන්ධ කර ගනිමින් වඩාත් කාර්‍යෂම හා ඵලදායී ආයෝජන කලඹක් තම සමිතිය අභ්‍යන්තරයේ සදා නොගතහොත් ඇතිවන හැකි දුෂණ වංචා වලක්වා ගත නොහැකිය.

එසේනම් දැන් ඔබට පෙනෙනවා නේද? නීතියේ තිබෙන දෙය ඒ ලෙසම ක්‍රියාත්මක කිරීමට පෙර අපගේ සමිතිය තුල තිබෙන ආයෝජන ප්‍රතිපත්තිය කෙතරම් කාර්යක්‍ෂමතාවකින් සහ ගුණාංග වලින් සම්පූර්ණ විය යුතුද කියා. මා දකින අඩුපාඩුව ඇත්තේ නීතියේවත්, තරගකාරී වෙළද ලෝකයේවත් නොව අප අභ්‍යන්තරයේ තිබෙන අකාර්‍යශමතාවය මත  බව නොකියාම බැරිය.

# ස.ණ.ස.
පුවත් කොළඹින්




## සංවර්ධන ගැටලු

**යූ.ඩී.එස්. වීරසිංහ - නැ.ඇරැව්වල සණස**

සූර්යාලෝකය, වාතය, ජලය, ගහකොළ, සතා සිව්පාවා ඇතුළත් භූමිය නමැති සාධකය මානවයාගේ පැවැත්ම සඳහා ඇති අගනා සම්පතකි. මිනිසා තම දැනුම ශක්තිය හා පුරුද්ද උපයෝගි කරගෙන මේ සම්පත් පරිහරණයෙන්, ගවේෂණය කිරීමෙන්, නව නිර්මාන ලොවට හෙළිකරයි. මුලු පෘතුවිය ව.මීටර මිලියන 510ක් වේ. මුළු පෘතුවියෙන් 71% වැසී ඇත්තේ ජලයෙනි. මානවයාට වාසය පිණිස ඇති ගොඩබිම, උශ්නාධික කාන්තාර, විශාල කඳු ශිඛර, හිම ආදියෙන් වැසී ඇත. වායු තලයේ කි.මී. 8 ක් පමණ ඉහළ ජීවින්ට වාසය කළ නොහැක. භෞතික සම්පත් හුදකලාව පැවතීම වෙනුවට, මානව සම්පත සමග ඒකරාශි වීමෙන් නව නිර්මාණ බිහිවේ. ඉතා කෙටි කාලයක් තුල ලෝකය නවීකරණය වීම, තාක්‍ෂණයේ දියුණුව, විශ්මය ජනකය. ලෝකය කුඩා වී ඇත. ක්ෂණිකව තොරතුරු සන්නිවේදනය කර ගතහැක. මිනිස් මොලය පරදන ක්‍රියාකාරකම් පරිඝනක ආශ්‍රයෙන් සිදුවේ. මේ සියල්ල සිදුවන්නේ භෞතික සම්පත්, මානවයාගේ මානසික හා කාර්ය ශ්‍රමය සමග එලදායි ලෙස කළමණාකරවීමේ ප්‍රතිඵලයක් වශයෙනි. ජනගහනයට සමගාමීව භාණ්ඩ හා සේවා සැපයුම් ඉහළ යා යුතුය. නැතිනම් ආර්ථික වර්ධනය ඇනසිටී. පාසැල් යන නොයන ළමා පිරිස මහල්ලන් සහ රෝගීන් දිළින්දන්, හා රැකියා විරහිත ජනතාවගේ බරද, රටක ශ්‍රම හමුදාවට දැරීමට සිදුව තිබේ.

අසුව දශකය වනවිට ලෝක ජනගහණය මිලියන හාරදහස් හයසියයක් ඉක්මවා තිබේ. වාර්ෂිකව 1.7% වර්ධනයක් සිදුවෙමින් පවතී. වැඩිවන ජනගහනයේ අවශ්‍යතා සපුරාලීමට වැයවන නිෂ්පාදන සඳහා ඛනිජ සම්පත් හීනවී යයි. පොසිල ඉන්ධන නිර්මානය වීමට වසර සියගණන් ගතවේ. දහඅට වන සියවසින් ඇරඹි කාර්මික විප්ලවය සමග නිෂ්පාදනය ක්‍රියාවලිය සඳහා ඛනිජ සම්පත් බහුලව භාවිත විය තවත් වසර 50ක දී පමන ඉන්ධන නිධි අවසන් වනු ඇතැයි විද්වත්හු ප්‍රකාශ කරති. දැනටමත් සූර්ය ශක්තිය, මුහුදු රළ, සුළඟ, බලශක්ති ආදේශක වශයෙන් භාවිතා කෙරේ.

ලෝකයේ බල ශක්ති සඳහා 45%ක් වැය කරන්නේ පෙට්‍රෝලියම්ය. සෑම දශකයකම බල ශක්ති පරිභෝජනය දෙගුණ වන බව ගනන් බලා තිබේ. පෘතුවිය සතුවගා කල හැකි ප්‍රමානයෙන් අඩකට වඩා දැනටමත් වගා කර අවසන්ය. තවත් වසර හතලිහකදී ලෝක ජනගහනය දෙගුණ වනු ඇත. එවිට ආහාර, සෞඛ්‍ය, නිවාස ප්‍රශ්න උග්‍රවනු ඇත. රසායනික පොහොර සහ කෘමිනාශක අසීමිතව භාවිතා කිරීමෙන් ස්වාභාවික සම්පත් විනාශ වීමට හේතුවී ඇත. ඇතැම් විද්‍යාඥයෝ අභ්‍යාවකාශ සංචාර සහ ග්‍රහ ලෝකවල මනුෂ්‍යවාස පිළිබඳව පරීක්‍ෂන කරමින් සිටිති.

ශ්‍රී ලංකාව ස්වාභාවික සම්පත් පිරි කුඩා දූපතකි. කෘෂිකාර්මික රටක් වු මෙහි විදේශ ආක්‍රමණ නිසා දේශපාලනික සහ ආර්ථික වෙනස්කම් රාශියක් සිදුවිය. අපනයන හා ආනයන ආර්ථිකයක් ගොඩනැගිනි. වැවිලි කර්මාන්තයට අනුබද්ධ දියුණු වු ප්‍රවාහන සේවය නිසා රටේ සුන්දරත්වය වර්ධනය විය. උමං සහිත කඳුකර දුම්රිය මාර්ගය, මුහුදු වෙරළ සහ කඳු මිටියාවත් සහිත මාර්ග පද්ධතිය විශේෂිතය. ප්‍රධාන ආර්ථිකය තේ. රබර්, පොල් වු අතර මුතුමැණික්, ඇත් දල හා කුළුබඩු සඳහා විශේෂ ඉල්ලුමක් පැවතුනි. රටේ කර්මාන්ත කෙෂ්ත්‍රයේ ප්‍රභල දියුණුවක් වෙනුවට, සම්ප්‍රදායික ලෝකුරු, මැටි, දැව කර්මාන්ත පැවතුනි. වී සහ ධන්‍ය ගොවිතැන පසුබාමින් වැවිලි කර්මාන්තයට රාජ්‍ය අනුග්‍රහය ලැබුනි. මුඩු බිම් පනත ඊට නිදසුනකි. වතුවගාව ආශ්‍රිතව යුරෝපීයයන් විසින් ඉන්දියානුවන් වතුකරයේ පදිංචි කරවීම නිසා බරපතල සමාජ ප්‍රශ්ණයක් ඇතිවිය. රටේ භූමි ප්‍රමාණය අක්කර එක්කෝටි හය ලක්‍ෂයකි. අක්කර තිස් ලක්‍ෂයක පමණ වැවිලි සඳහා වෙන්විය. 1937 දී ජාතික ආදායමින් 67%ක් ලැබුනේ කෘෂි අපනයනයෙනි. ලෝක යුද්ධ සමයේ භාණ්ඩ මිල ඉහළ යෑමෙන් ආනයනය සීමාවිය. මැලේරියා වසංගතය ඇතිවීමද සමාජයට හානිකර විය. එකදාස් නවසිය තිස් ගණන් වල ඇරඹි ගොවිජනපද ව්‍යාපාරය වැදගත් පියවරකි. 1935-1950 අතර ගොවිපවුල් හැට දාහකට අධික සංඛ්‍යාවක් වියලි කලාපයේ අලුතින් පදිංචි කරන ලදී. 1949 ඇරඹි ගල්ඔය සංවර්ධන ව්‍යාපරය වැදගත් පියවරකි. වී සදහා සහතික මිල, පොහොර සහනාධාරය, ආහාර සලාකය, දිළිදු සහනාධාරය ආදිය ජනතා සුභවාදි ක්‍රියාමාර්ගයන් විය. ඩී.එස්. සේනානායක, ඔලිවර් ගුණතිලක, මහාචාර්ය ගුණදාස වැනි මහතුන් සමුපකාර ව්‍යාපාරය හරහා පාරිභෝගික සේවා දියුණු කල අතර, සුලු ව්‍යාපාරික සහ ගොවි ණය සහන සලසන ලදී.

නිදහස ලැබී වසර හැත්තෑවක් ගතවී ඇතත්, විදේශ ණය බරින්, නිදහස් වීමට හැකියාවක් ලැබී නැත. බිලියන ගණනින් විදේශ ණය බර වැඩිවෙයි. රාජ්‍ය සේවයේ ලක්‍ෂ දහසයක පිරිසක් නඩත්තු කල යුතුය. පාර්ලිමේන්තු නියෝජිතයන් 225 ඇතුලු පලාත් පාලන නියෝජිතයන් නඩත්තුව විශාල වියදමකි. තීරු ගාස්තු සහන යටතේ මොවුන්ට රජයේ උසස් නිලධාරින්ට සුඛෝපභෝගි වාහන ආනයනයට විශාල ධනයක් වැයවේ. රුපියලක් උපයන විට, රු 3ක් ණය පියවිම සඳහා වැයවේ. මෙම කුඩා දිවයිනේ අයමාර්ග වලට වඩා, වැයවීමේ අධික බැවින් රට සංවර්ධනයක් කරා යොමුකිරිමට දුෂණය, වංචාව, කොමිස් ගැසිම, නතර කළ යුතුය. දේශපාලකයන් ඇතුලු සැමගේ අවංක කැපවීම මේ සඳහා අත්‍යාවශ්‍යය.

## මාසික තිළිණය

ස.ණා.ස. කොළඹ පුවත් මාසික ප්‍රශ්ණයට කූපනය මගින් ඔබ සපයන, නිවැරදි පිළිතුරට තිළිණයක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කර ඇති බව සතුටින් දන්වමු.

ඔබ ජයග්‍රහකයෙක් නම්, ඔබේ සමිතියේ හා පෞද්ගලික අනන්‍යතාවය තහවුරු කරවා එම තිළිණය දිසා සංගමයෙන් ලබාගන්න.

**සංස්කාරක මණ්ඩලය**

## කියවන්න... දැනුම ලබන්න....

### දෝතට තෑගි ගන්න ....

ඔබ කළ යුත්තේ මෙහි පළවන ප්‍රශ්ණයට පිළිතුර කූපනයේ පුරවා තැපැල් පතක අලවා සණස පුවත් කොළඹින් අංක 220/1, හයිලෙවල් පාර, වත්තේගෙදර, මහරගම වෙත 2019 සැප්තැම්බර් 15 ට පෙර එවීමයි. ජයග්‍රාහකයින් රැසක් සිටියහොත් කුසපත් ඇදීමෙන් වාසනාවන්තයා තෝරා ගනු ලැබේ.

**ප්‍රශ්ණය :- ලෝකයේ බල ශක්ති සදහා 45%ක් වැය කරන්නේ කුමක් සඳහාද?**

## කූපන් තරගයේ ජයග්‍රහණය

**කූපන අංක 06**

**සී.ර. වග නැගෙනහිර සණස සමිතියේ**
**එච්.ඩී.ආර්. සෙනෙවිරත්න**

## කූපන් අංකය 08

මුලකුරු සමග නම: ..........................................................

ස්ථිර ලිපිනය: ..........................................................

..........................................................

දුරකථන අංකය: ..........................................................

පුරුදු අත්සන: ..........................................................

සණස සමිතියේ නම: ..........................................................

..........................................................


පිළිතුර: ..........................................................


..........................................................


## සුභ උපන්දිනයක් වේවා !!

### කරගම්පිටිය සමිතියේ පසුගිය මස උපන් දිනය සැමරූ අය


සී. පද්මිණි


ශිරෝමි සිල්වා


පී. අපෝන්සු



එච්. ශ්‍රියාලතා



එස්. ප්‍රනාන්දු



විජිතා නාලනි


ඩී.එස්. ස්විකාන්ති



සුනිතා පෙරේරා



ඈන් චමරි



අයි. රෝහිණි


අයි. පීරිස්



සී. බණ්ඩාර


ඒ.වී. සුදර්ශනී



නිතා සිරිමති



සනත් ප්‍රනාන්දු



එන්. හිමාලි



ආර්. දාබරේ



ප්‍රනීත් උක්වත්ත



එන්. මංගලිකා



එස්. නවෝදිනි



සී. ස්වර්ණාරාජිනි


සේන සිසිර


එච්.පී. කරුණාරත්න


එන්. ප්‍රනාන්දු


ජේ. නිමල්


එස්. පෙරේරා

01 පිටුවෙන්....

## ප්‍රකාශනයෙන් ප්‍රබුද්ධ සමාජයක්.....

මාධ්‍යයේ වගකීම ප්‍රබුද්ධ සමාජයක් අති කිරීමයි' යන සංකල්පයෙන් දේශනයට ආරම්භයක් ගත් තිලකරත්න කුරුවිට බණ්ඩාර මහතා, සංකල්පය. සක්‍රීය නොවීමට උදාහරණ දක්වමින් ප්‍රකාශනයක අරමුණ සමුපකාර ව්‍යාපාරයයි. එම අරමුණට උචිත පරිදි ප්‍රකාශනයේ නම නිර්මාණ විය යුතුයි. ඊට ඉතිහාසයෙන් උදාහරණ ලෙස, මුණිදාස කුමාරතුංග විද්වතාණන් 1936 දී එළි දක්වන 'ඉලපත' නම් වු පුවත්පත පෙන්වා දුන්නේය. 'ඉලපත' කරන කාර්‍යය භාරය වන්නේ පිරිසිඳු කිරීමයි. කසල ඉවත් කරමින් අවට පරිසරය පවිත්‍ර කිරීමට ඉලපත යොදා ගනී. සමාජයේ කුණු ඉවත් කිරීමට මෙම පුවත් පත, නමෙන් ශක්තියක් වු බව පෙන්වා දුන්නේය.

අද නව තාක්‍ෂණයෙන් දියුණු වී ඇතත් වාර්තාකර ගොනුකර තබා ගැනීමේ අරමුණ පත්‍රයෙන් ඉටුකර ගත හැකි බව පැහැදිලි කලේය. එසේ ගොනුකර තබන පුවත් හී වචන භාවිතය නිසි සේ සිදුව තිබිය යුතුය. එදා දාර්ශනික කොම්පියුසියස් ගේ ප්‍රකාශනයක් මෙසේ දක්වන ලදී. 'රාජ්‍ය බලය මට ලැබුනොත් භාෂාව නිවැරදි කිරීම ප්‍රමුඛ කාර්ය්‍යයයි. නිවැරදි භාෂා හැසිරවීම තුළින් සමාජයට යහපත් සන්නිවේදනයක් දීම ලේඛණයක තිබිය යුතුය. භාෂාව ලියන්නා විසින් කියවීම ප්‍රගුණ කළ යුතුවේ.

1930 දී සිළුමිණ පුවත් පතෙහි ආරම්භය වුයේ 'සත දහයේ විශ්ව විද්‍යාලය' යන නාමයෙන් ප්‍රචලිත වීමයි.

ප්‍රවෘත්තියක් නිවැරදි විය යුතුයි. එය ත්‍රිකෝනයක හැඩය ගනී. නන්දදාස කෝදාගොඩ විද්වතානන් මෙම කාර්යයේදී අමතක නොකළ යුතුයි. එසේම ඇත්ත පත්‍රයේ කතු තුමා බී.ඒ. සිරිවර්ධන මහතාද ප්‍රවෘත්තිකරණයෙහි දක්‍ෂයෙකි. පුවත් පතක තීරුලිපි සපයන්නාද විශේෂකාර්යයක් කරන්නෙකි. චන්ද්‍රරත්න මානවසිංහ ශූරීන් විශිෂ්ඨ තීරුෑ ලිපි රචකයෙකි. එසේම දයාසේන ගුණසිංහ මහතාද දැඩි ග්‍රහනයක් ගෙන තීරුෑ ලිපි සැපවූවෙකි.

ඔබේ සණස පුවත් කොළඹින් පුවත්පතට දිගු ඉතිහාසයක් ඇත්තේ, මානව දයාවෙන් ඔබේ අරමුණටයමින්, සණස ව්‍යාපාරයට සේවාවක් ඉටු කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලය බව කිව යුතුයි.

වැඩමුළුව අවසානයේ කැස්බෑව කලාපීය ගරු අධ්‍යක්‍ෂ හා ප්‍රකාශන කමිටු සාමාජික සී ගමගේ මහතා විසින් ස්තුතිය පුද කරන ලදී.

**සැකසීම - හේමසිරි බෙනරගම**

### ජාතක කතා පොතෙන්
## මහා පිංගල ජාතකය

| | |
|---|---|
| අනුකම්පා නොමැති පිංල නම් | රජුය |
| අදැහැමි කමින් රට පාලන කළ | රජුය |
| පිංගල රජුට පුතෙකුව සිටි කුල | රජුය |
| පියතුම ඇවෑමෙන් බෝසත් පුර | රජුය |
| පිංගල රජුගෙ වියොවින් රට වැසි | සැවොම |
| සතුටින් ඉපිල උත්සව සිරියකි | පුරම |
| අබිසෙස් ලබා මහ බෝසත් රජු | පරම |
| අයිතිය, සිහසුනෙහි ලැබ වැජඹුනි | වරම |
| ප්‍රීතිය විදින හැම එක් වී | පුරවරයේ |
| පාලක දොරටුවේ හඩමින් සොව | දුටියේ |
| රජතුම කරුණු විමසයි පාලක | කුටියේ |
| මපියන් ඔබට සුහදව සිටියෙද | කෙළියේ |
| නැත, රජතුමනි, මා තැවෙනුයෙ බිය | මතුවී |
| පිංහල රජතුමා ටොකු පිදුමෙන් | තුටුවී |
| පහයට නගින බසිනා හැම විට | ගැතිවී |
| ටොකු අටබැගින් වින්දෙමි හිස දැන් | රතුවී |
| නිරයෙන් මිදී රජු මෙලොවට එතැයි | සිතේ |
| යමරජුටත් හිංසන දී කුරිරු | සිතේ |
| නැවතත් පෙරසේම ටොකු අට බැගින් | රතේ |
| ඇතිකර දීම, බිය ගෙනදෙයි හැම | මොහොතේ |
| අපවත් වු තෙරුන් දෙව්දත් හා | සමවී |
| උත්සව පවත්වා ලෝවැසියන් | මතුවී |
| අදැහැමි රජෙකුගේ මරණය ගැන | තුටුවී |
| සිටියත්, පිරිස, බිය සංකා එයි | මතුවී |

*උපදේශය: හිංසාකාරී පුද්ගලයා කිසිවෙකුටත් ප්‍රියනොවේ.*

*-සිරි-*



**ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිවරයෙකු**
**මෙන්ම**
**භාණ්ඩාගාරයේ මුදල් අධ්‍යක්‍ෂවරයකු වු**

## සංගමයේ සභාපතිගෙන්

### ප්‍රශ්න විමසා පිලිතුරු ලබා ගන්න.

**ප්‍රශ්ණය** : සමිතියට සුලු මූල්‍යමය වංචාවක් කළ අයකු කාරක සභාවට පත් කළ හැකි ද? හැකිනම් කොපමණ කාලයකට පසු ද?

**පිළිතුර** : මුදල් වංචාවක් සුලු ද විශාලද යන්න අදාළ වන්නේ නැත. එවැන්නකු කාරක සභාවේ සිටීම නිසා සාමාජිකත්වය හෝ ගනුදෙනුකරුවන් සමිතිය කෙරෙහි ඇති කරන්නා මතය සමිතියට කීර්තිය, විශ්වාසනීයත්වය වැඩි වීමට හේතු නොවන්නේ නම් එවැනි පත්වීමක් සිදු නොවිය යුතුය.

**ප්‍රශ්ණය** : එක නිවසක දෙදෙනෙකු නිලධාරී මණ්ඩලයේ හා කළමනාකාරිත්වයේ සිටිය හැකි ද?

**පිළිතුර** : එසේ සිටීමෙන් සාමාජිකයින් හා ගනුදෙනු කරුවන් තුළ ඇති විය හැක්කේ මුදල් ගනුදෙනු කරන තැනක් නිසා හොද ප්‍රතිචාරයක් දැයි කල්පනා කරන විට මට පෙනී යන්නේ එයින් සමිතියේ ගනුදෙනු කෙරෙහි විශ්වාසයක් වැඩි නොවන බවය. මූල්‍ය කටයුතු කරන ආයතනවල විශේෂයෙන් එවැනි සබදතා ඇති අය එක් ස්ථානයක යොදවන්නේ ද නැත. අවභාවිතාවන් වීමේ ඉඩක් පවතින බවට ඇතිවන මතය සමිතියේ යහපතට හේතු නොවේ. සමිතියට වඩාත් යහපත වන්නේ එකම පවුලේ අය කාරක සභාවේ හෝ සේවකයින් හැටියට සිටීම නොවේ.

**ප්‍රශ්ණය** : ණය ගෙවීමේ හැකියාව මනින්නේ කෙසේ ද? වැටුප් වාර්තාවෙන්ද ? එහෙම නැති අයට ණය ලබා දෙන්නේ කෙසේ ද?

**පිළිතුර** : සාමාජිකයින් පිලිබදව කාරක සභාවේ අයට වැටහීමක් ලබා ගැනීමට ලියවිලි අවශ්‍යවන්නේ නැත. ඔවුන් කැදවා විමසා බැලීමෙන් , නිවසට ගොස් විපරම් කර බැලීමෙන් වටහා ගත හැකිය. මාසික වැටුපත් ලබා ගන්නේනම් වැටුප් වාර්තාවක් බැලීමෙනුත් එය වටහා ගත හැකිය. මෙම හැකියාව ඇත්තේ සමිතියකට පමණි. වෙනත් මූල්‍ය ආයතනවල කරනු ලබන ලිඛිත වාර්තා අවශ්‍යවන්නේ නැත.සමහර විට සාමාජිකත්වය දරන තැනැත්තියට ආදායමක් නැති අතර, ඇයගේ ස්වාමියාගේ ආදායම සැලකිල්ලට ගත යුතුය.

**ප්‍රශ්ණය** : යම් සමිතියක විගණනයේ දී හෙළිවී ඇති මුදල් අඩුව කළමනාකරු විසින් ලිඛිතවම බාරගෙන ඇත. එහෙත් මෙතෙක් ගෙවා නැත. සේවය කරන්නේද නැත. එමමුදල් අයකරගන්නේ කෙසේ ද?

**පිළිතුර** : දින 14 කට නොඅඩු කාලයක් දී ගෙවන ලෙසට එන්තරවාසියක් යැවිය යුතුය. එයට දක්වන ප්‍රතිචාර කාරක සභාව පිළි නොගන්නේනම් තීරක ප්‍රදානයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. මුදල් ගෙවිය යුතු බවට ප්‍රදානයක් ලැබුනේ නම් නිසි කාලය ඉක්මවූ විට ගෙවා නැත්නම් අධිකරණය මගින් බල ගැන්වීම කළ යුතුය.

**ප්‍රශ්ණය** : සේප්පුවේ රු.1000 ක මුදලක් අඩුවීම පරීක්ෂා කිරීමෙන් පසුව එම මුදල පියවූ අය දැන් වෙනත් මූල්‍ය ආයතනක කටයුතු කරමින් එම ආයතනයෙන් සමාජිකයින්ට ණය ලබා දීමට කටයුතු කරයි. කුමක් කළ හැකිද?

**පිළිතුර** : එම ආයතනට මොහු සේවයෙන් ඉවත්වූ හේතුව දන්වා යැවිය හැකිය. සාමාජිකත්වය ද දැනුවත් කළ හැකිය. එසේම සාමාජිකයින්ට ණය දිය යුත්තේ බාහිර ආයතනවලින් ලබා ගත් ණය ඇති අයට එම ණය ගෙවමින් සමිතියේ ණය වාරික ද ගෙවීමේ හැකියාව ඇත්නම් පමණි.

**ප්‍රශ්ණය** : ඉඩමක් මිලට ගැනීම සදහා ආයෝජන කිරීම සුදුසු ද?

**පිළිතුර** : සමිතියක ස්ථාවර වත්කම් තිබිය යුත්තේ මුලු වත්කමින් 10% කට වැඩි නොවන පරිදි ය. ඒ නිසා ඒ ගැන මෙන්ම ඉඩම ලබා ගන්නේ ඵලදායක කරුණක් සදහා ද යන්න ද සලකා බැලිය යුතුය. සමිතියේ අවසන් ආදායම් හා මූල්‍ය වාර්තා සමග සංගමයට පැමිණ සාකච්ඡා කළහොත් හොඳ උපදේශයක් ලබා ගත හැකිය.

**ප්‍රශ්ණය** : තැන්පත් පොලියට වඩා 5% ක් ණයට අය කිරීම සුදුසු ද එය අඩුකළ හැකි ද?

**පිළිතුර** : මෙවැනි පරතරයක් ඇති ණය දීමේ වරදක් නැත. ආදායම සමාලෝචනය කරමින් වර්ෂයේ විය හැකි අතිරික්තය ඉහල අගයක් ගන්නේ නම් ණය කරුවන් සදහා වර්ෂයතුළ ඔවුන් ගෙවා ඇති ණය සදහා වූ පොලියෙන් යම් ප්‍රමාණයක් එනම් 5% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඔවුන්ට ආපසු ගෙවීමට ද හැකිය. අතිරික්ත බහුලව ඇත්නම් තැන්පත් කරුවන්ට වුවද අතිරේක පොලියක් අදාළ වර්ෂය සදහා ගෙවීමට සමිතියට තීරණය කළ හැකිය. එසේ කරමින් අතිරික්තය අවම කළ හැක. සමුපකාරය ලාභය උපරිම කිරීම අරමුණ නොවේ සේවාව ප්‍රමුඛ වේ. කළ යුත්තේ ගනුදෙනු කරුට සාධාරණය ඉටු කිරීමටයි. පාඩුවක් ලැබිය යුතු නැත.

## අභ්‍යන්තර විගණන කමිටු පුහුණු වැඩසටහන

හංවැල්ල හා පාදුක්ක කලාපීය අභ්‍යන්තර විගණන කමිටු නිලධාරින් පුහුණු කිරීමේ වැඩසටහනක් පසුගියදා මාවතගම සණස සමිති ශාලාවේදි පැවැත්වීමට යෙදුනි.

එම වැඩසටහන සදහා සම්පත් දායකත්වය කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ ගරු උප සභාපති මෙත්සිරි ජයකොඩි මහතා විසින් ලබාදෙන ලදී.

එහිදී අතුරු ව්‍යවස්ථා නියමයන්ට අනුව අභ්‍යන්තර විගණන කමිටු පත් කිරීම, බලතල හා කාර්යභාරය, කමිටු තීරණ වාර්තා ගත කිරීම, ඉදිරිපත් කිරීම හා විගණනය සිදුකල යුතු ආකාරය යන කාරණා යටතේ වැඩසටහන මෙහෙයවන ලදී.

**වාර්තාකලේ - දිස්නා නයෝමි, එම් ප්‍රිදර්ශි හංවැල්ල-පාදුක්ක කලාප සම්බන්ධීකරණ ලේකම්**

# දියගම සණස සමිතියේ 33 වන සංවත්සරය දා...

සීමාසහිත දියගම සණස සමිතියේ 33 වන සංවත්සරය දියගම සාලවනෝද්‍යාරාම විහාරස්ථානයේදී කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ හෝමාගම කලාපීය අධ්‍යක්ෂ අතුල ප්‍රසන්න ගීකියනගේ මහතාගේ ප්‍රධානත්වයෙන් හා දියගම සාලවනෝද්‍යානාරාම විහාරාධිපති හෝමාගම ජනාධිපති විද්‍යාලයේ ධර්මාචාර්ය ශාස්ත්‍රපති පූජ්‍ය දියගම ධම්ම රක්ඛිත ස්වාමීන් වහන්සේ, දියගම පර්ෂද සම්බන්ධීකරන ලේකම් නිර්මදා ජිනාදරී මහත්මිය, දියගම පර්ෂදයට අයත් මාබුල්ගොඩ සණස සමිතියේ ගරු සභාපති සුජාතා මල්කාන්ති මහත්මිය, බ්‍රාහ්මනගම සණස සමිතියේ ගරු සභාපති රසිකා කොතලාවල මහත්මිය හා කිරිවත්තුඩුව සණස සමිතියේ ගරු සභාපති නිශාන්ත අබේවික්‍රම මහතාගේ සහභාගීත්වයෙන් ඉතා උත්සවශ්‍රීයෙන් 2019 පෙබරවාරි මස 04 වන දින පැවැත්විණ.

මෙදින 2019 වර්ෂය සඳහා නව නිලධාරී මණ්ඩලයක් තෝරා පත්කර ගැනීම, 2018 වර්ෂයේ වැඩිම සාමාජික, සාමාජික නොවන, සාමාජික ස්ථාවර, සාමාජික නොවන ස්ථාවර, ළමා තැන්පතු, මාසික මහසභා රැස්වීම් වලදී වැඩිම සාමාජික තැන්පතු, හොඳම ණය ගෙවීම හා 2018 වර්ෂයේ මාසික මහසභා රැස්වීම් සඳහා වැඩිම පැමිණීම ඇති සාමාජික සාමාජිකාවන්ට ත්‍යාග පිරිනැමීමද මෙදින සිදු කෙරින.

දියගම සණස සමිතියට අනුබද්ධ 'සෙත්සිරි' ළමා සමාජයේ දරු දැරියන්ගේ විශේෂාංග වලින් මෙදින උත්සවය අලංකාර විය.

### 2019 වසරේ නිල මඬුල්ල

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | : | ධර්මසේන අමරතුංග මහතා |
| **ගරු උපසභාපති** | : | ප්‍රේමසිරි වීරසූරිය මහතා |
| **ගරු ලේකම්** | : | චමිලා ජයතුංග මිය |
| **ගරු භාණ්ඩාගාරික** | : | කේ.ඒ.ඩී.වී. සමරසිරි මහතා |
| **කාරක සභික** | : | ධර්මසිරි කුමාරගේ මහතා |
| | | බන්දුල නානයක්කාර මහතා |
| | | අනිල් අබේසිරි මහතා |
| | | ඕෂදී ලක්ෂානි මෙනවිය |
| | | කසුන් මධුෂංක මහතා |

### ක්‍රියාත්මක අනු කමිටු

- ✧ විගණන කමිටුව
- ✧ මුදල් කමිටුව
- ✧ කාන්තා කමිටුව
- ✧ සුභ සාධක කමිටුව
- ✧ තරුණ කමිටුව
- ✧ අධ්‍යාපන කමිටුව
- ✧ සංවර්ධන කමිටුව
- ✧ සෙත්සිරි ළමා සමාජය

## දියගම සණස සමිතියේ 2018 වර්ෂයේ ප්‍රගතියෙන් බිදක්....

#### මූල්‍ය කටයුතු හා තැන්පතු වර්ධනය

- ✧ 2018.01.01 දින සිට 2018.12.31 දක්වා සියළුම තැන්පතු වල ලැබීම් ප්‍රමාණය රු 57,869,354.50 කි.
- ✧ සෑම මසකම මාසික මහසභා රැස්වීම් වලදී තැන්පතු මුදල් එකතු කිරීම
- ✧ 2017 වර්ෂයේ සකසුරුවම් මාසය වෙනුවෙන් ළමා ගිණුම් හිමි දරු දැරියන්ට හා සාමාජිකයින්ට ලබාදුන් ඉතුරුම් කැට 2018 සකසුරුවම් මාසයේදී භාරගැනීම. වැඩිම මුදලක් ඒකරාශිකරණය කරන ලද ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබාගත් දරු දැරියන්ට හා සාමාජිකයින් සඳහා ත්‍යාග ඉතුරුම් කැට ලබාදීම.

#### ණය නිකුත් කිරීම

- ✧ සාමාජික ණය, දේපල ණය, ස්වයංරැකියා ණය හා අත්තිකාරම් ණය රු 23,788,227/-
- ✧ උත්සව ණය, වන්දනා ණය, අධ්‍යාපන ණය, ක්ෂණික ණය හා සාමාජික නොවන ස්ථාවර අත්තිකාරම් ණය රු 3,384,559/-

#### අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් හා ආගමික වැඩසටහන්.

- ✧ නව වර්ෂයට සෙත්පතා ජනවාරි 01 දින බෝධිපූජා පිංකම
- ✧ වෙසක් පුර පසලොස්වක පොහොය නිමිති කරගෙන වාර්ෂිකව සංවිධානය කරනු ලබන වෙසක් ධර්ම දේශනය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලි හා අභිධර්ම පිළිබඳ මහාචාර්ය පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන් විසින් 2018.04.09
- ✧ දිගයම සාලවනෝද්‍යානාරාම විහාරස්ථානයේ ඉදිකරන ලද නව දාන ශාලාවේ කබඩ් ගැසීම සඳහා මූල්‍ය පරිත්‍යාග රු 35,000/- දාන ශාලාව විවෘත කිරීම වෙනුවෙන් පවත්වන ලද සෙත්පිරිත් පිංකම වෙනුවෙන් ගිලන්පස දානය හා පිරිකර පූජා කිරීම. මෙදින සහභාගි වූ සියලු දෙනා වෙනුවෙන් සංග්‍රහය පැවැත්වීම.
- ✧ වෙසක් පොහොය නිමිත්තෙන් දියගම නැගෙනහිර නව යොවුන් සුභසාධක සමිතිය මගින් පවත්වනු ලැබූ බත් දන්සැල සඳහා මුදල් පරිත්‍යාග කිරීම.
- ✧ දියගම ශ්‍රී සාලවනෝද්‍යානාරාම විහාරස්ථානයේ වාර්ෂික ලේ දන්දීමේ පිංකම වෙනුවෙන් මුදල් පරිත්‍යාග සිදු කිරීම.

#### සුභ සාධක වැඩසටහන්

- ✧ වාර්ෂික එක්දින වන්දනා චාරිකාව (2018.01.27) අනුරාධපුර අටමස්ථානය
- ✧ වියළි ආහාර ද්‍රව්‍ය පරිත්‍යාගය අඩු ආදායම්ලාභී හා අසනීප තත්වයෙන් පසුවන, දියගම බටහිර හා නැගෙනහිර වාසය කරන පවුල්වල පුද්ගලයින් 15 දෙනෙකු තෝරාගෙන වියළි ආහාර ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම.
- ✧ සුභ සාධක අංශය මගින් පවත්වන ලද වාර්ෂික වන්දනා චාරිකාව 2018.09-07/08 දින දෙකක් කතරගම සංචාරය
- ✧ වාර්ෂික එක්දින චාරිකාව 2018.12.22 නුවර දළදා මාලිගාව, අම්බුළුවාව, කොත්මලේ මහා සෑය සංචාරය.

#### කාන්තා වැඩසටහන්

- ✧ සිංහල අළුත් අවුරුදු පොළ පැවැත්වීම 2018.04.08
- ✧ හෝමාගම කලාපීය කාන්තා වැඩසටහන් මාලාවේ ආස්මී සැදීමේ පුහුණු වැඩසටහන සංවිධානය කිරීම. 2018.07.15
- ✧ කොළඹ දිස්ත්‍රික් මධ්‍යම කාන්තා කමිටුව මෙහෙයවීමෙන් පවත්වන ලද කාන්තා වැඩසටහන්වලට හා හෝමාගම කලාපීය කාන්තා කමිටුව මගින් පවත්වන ලද වැඩසටහන් සඳහා කාන්තාවන් සහභාගී කරවීම.

#### පුහුණු හා අධ්‍යාපනික වැඩසටහන්

- ✧ දියගම පර්ෂදයේ සාමාජික පුහුණු වැඩසටහන 2018.07.08 සම්පත් දායකත්වය - කොළඹ දිස්ත්‍රික් සංගමයේ ජ්‍යේෂ්ඨ කළමනාකරු සම්පත් ශ්‍රී නලින්ද මහතා
- ✧ හිටපු භාණ්ඩාගාරික ඒ.ඩී.එස්. රත්නසිරි මහතාගේ 'ඒ.ඩී.එස්. රත්නසිරි ශිෂ්‍යත්ව අරමුදල' මගින් අඩු ආදායම් ලාභී පවුල්වල දරු දැරියන් සඳහා ශිෂ්‍යත්ව මුදල් ලබාදීම.
- ✧ 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන්ට හා අ.පො.ස. (සා.පෙළ) සමත් දරුවන්ට මූල්‍යමය ත්‍යාග ලබාදීම.
- ✧ සාමාජික සාමාජිකාවන්ගේ, පාසල් අධ්‍යාපනය හදාරණ දරු දැරියන්ට හා සණස බැංකුවේ ළමා ගිණුම් හිමි දරුදැරියන් සඳහා නව පාසල් වාරය වෙනුවෙන් පාසල් අභ්‍යාස පොත් ලබාදීම. 2018.12.02
- ✧ පුස්තකාලය සඳහා නව පොත් ලබාගැනීම.

#### ආරක්ෂණ ක්‍රම

- ✧ කොළඹ දිස්ත්‍රික් සණස සංගමය මගින් ක්‍රියාත්මක කරනු ලබන දිවිරැකුම, ණය රැකුම, සේප්පු, මාර්ගස්ථ මුදල්, මංකොල්ල කෑම් හා මුදල් ප්‍රවාහනය කරන්නන්ට වන අනතුරු ආරක්ෂණ ක්‍රම සඳහා දායකවීම.

#### දිවිරැකුම ආරක්ෂණය

- ✧ දිවිරැකුම ආරක්ෂණ ක්‍රමයට 2006 වසරේ සිටම දායකත්වය ලබාගෙන ඇති අතර, 2018 වර්ෂයේ මාසික මහාසභා රැස්වීම් සඳහා වැඩිම පැමිණීම ඇති සාමාජික 108 දෙනෙකු සමිතියේ අරමුදලින් වාර්ෂික දායක මුදල රු 300/- යටතේ 'දිවිරැකුම' ආරක්ෂණ ක්‍රමයට 2019 වර්ෂය සඳහා දායක කර ඇත.
- ✧ දිවිරැකුම ආරක්ෂණ ක්‍රමයෙන් 2018 වර්ෂයේ දී සාමාජික අංක 107 බ්‍රම්පි ප්‍රනාන්දු මහතාගේ අභාවය සඳහා රු 30,000/-ක්ද, සාමාජික අංක 39 - පි.ඩී. ස්වර්ණා පද්මිණී මහත්මියගේ අභාවය සඳහා රු 30,000/- ක්ද, සාමාජික අංක 04 ඒ.ඩී.එස්. රත්නසිරි මහතාගේ අභාවය සඳහා රු 30,000/-ක්ද, සාමාජික අංක 390 එච්. විමලාවති මහත්මියගේ අභාවය සඳහා රු 30,000/- ක්ද, සාමාජික අංක 203 ඒ.ඩී. නන්දාවතී මහත්මියගේ ස්වාමි පුරුෂයා ඩබ්.එස්. පෙරේරා මහතාගේ අභාවය සඳහා රු 18,000/- ක මුදලක් ද ප්‍රතිලාභ ලබාදී ඇත.

#### ණය රැකුම

- ✧ පුද්ගල ඇප මත ලබාදෙන සාමාජික ණය, ස්වයංරැකියා හා භාණ්ඩ ණය නිකුත් කිරීමේදී රු 1000/- ට රු 5/- ක මුදලක් ණය ලාභීන්ගෙන් අයකර ගන්නා අතර, එමගින් ණය ආරක්ෂණ අරමුදලක් පිහිටුවා ඇත.
- ✧ 2018 වසර සඳහා ආවරණය කළ යුතු ණය ශේෂය මත රු 13,626,000/- ක ණය ශේෂය සඳහා රු 68,130/- ක මුදලක් ගෙවා කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ ණය රැකුම ආරක්ෂණ ක්‍රමයට දායක වී ඇත.

#### සිංහල අලුත් අවුරුදු උත්සවය

- ✧ සිංහල අලුත් අවුරුදු උත්සවය නිමිත්තෙන් රු 20,000/- ක උත්සව අත්තිකාරම් ණය මුදලක් 14% වාර්ෂික පොළියට සාමාජිකයින් වෙත ලබාදුන් අතර, එම ණය ලබාගත් සාමාජිකයින් ගණන 121 කී. ලබාදුන් මුදල 2,221,000/- කි.
- ✧ අප්‍රේල් මස 14 වෙනි දින චාරිත්‍රානුකූලව ගණුදෙනු කිරීමට සාමාජිකින්, සාමාජික නොවන අය හා ළමා සාමාජිකයින් සහභාගී වූහ. ගණුදෙනු කළ සියලු දෙනාටම ත්‍යාගයක් ලබාදෙන ලදී. මෙදින මුළු ලැබීම් මුදල රු 4,222,448/-කි.

#### කාර්යඵල ඇගයීම

- ✧ සී.ස. කොළඹ දිස්ත්‍රික් සණස සංගමය කොළඹ දිස්ත්‍රික්කයේ සණස සමිති අතර 2017 වර්ෂයට අදාළ කාර්යඵල ඇගයීම 2018 වර්ෂයේදී සිදුකරන ලදී. එම කාර්යඵල ඇගයීමේ දී කාර්යඵල තරගාවලියට, කොළඹ දිස්ත්‍රික්කයේ ඉදිරිපත් වු සණස සමිති අතුරින් විසිවක් වන ස්ථානය හිමිකර ගනිමින්, අප සමිතියට බී ශ්‍රේණියේ සමිතියක් බවට පත්වීමට හැකිවිය. ඒ වෙනුවෙන් අප සමිතියට තිලිණයක් හා සහතික පත්‍රයක් හිමිවිය.

#### ළමා සමිතිය

- ✧ සීමාසහිත දියගම සණස සමිතියට අනුබද්ධ 'සෙත්සිරි' ළමා සමාජයේ මාසික රැස්වීම සෑම මසකම පළමු සතිය ඉරුදින දියගම විහාරස්ථ ධර්මශාලාවේ දී පවත්වන ලදී.

**චමිලා ජයතුංග - දියගම සණස ලේකම්**

# දියගම සණස සමිතියේ 33 වන සංවත්සර සැමරුම



ගරු කාරකසභාව







සංවත්සර අවස්ථා





ළමා සමාජයේ දරුවන්ට පාසැල් පොත් නොමිලේ ලබාදීම.





සකසුරුවම් මාසය වෙනුවෙන් අවස්ථා



දිස්ත්‍රික් සංගමය මගින් සංවිධානය කරන ජාත්‍යන්තර ළමා දිනයට සහභාගි විය.



පුහුණු වැඩසටහන්



වන්දනා චාරිකාව